**විශේෂ සටහන 12**

## ප්‍රධාන ආර්ථික ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග[1]

**මුදල් ප්‍රතිපත්තිය[2]**

2021 අගෝස්තු 19 - නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය, පිළිවෙළින්, සියයට 5.00 සහ සියයට 6.00 දක්වා පදනම් අංක 50කින් ඉහළ නංවන ලදී. බැංකු අනුපාතිකය සියයට 8.50 සිට සියයට 9.00 දක්වා ස්වයංක්‍රීයව වැඩි විය.

- 2021 සැප්තැම්බර් 01 දිනෙන් ආරම්භ වන සංචිත පවත්වා ගෙන යෑමේ කාලපරිච්ඡේදයේ සිට ක්‍රියාත්මක වන පරිදි, සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් ශ්‍රී ලංකාවේ ව්‍යවහාර මුදලින් පවත්වාගෙන යනු ලබන මුළු තැන්පතු වගකීම්වලින් සියයට හතරක ප්‍රමාණයක් සංචිතයක් ලෙස පවත්වාගෙන යා යුතු බවට මෙහෙයුම් උපදෙස් නිකුත් කරන ලදී.

2022 ජනවාරි 20 - නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පදනම් අංක 50කින් පිළිවෙළින් සියයට 5.50ක් සහ සියයට 6.50ක් දක්වා ඉහළ නංවන ලදී. බැංකු අනුපාතිකය සියයට 9.00 සිට සියයට 9.50 දක්වා ස්වයංක්‍රීයව ඉහළ ගියේය.

2022 මාර්තු 04 - නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පදනම් අංක 100කින් පිළිවෙළින් සියයට 6.50කින් සහ සියයට 7.50කින් ඉහළ නැංවිණි. බැංකු අනුපාතිකය සියයට 9.50 සිට සියයට 10.50 දක්වා ස්වයංක්‍රීයව ඉහළ ගියේය.

2022 මාර්තු 07 - විනිමය අනුපාතිකය වෙනස් වීමකට ඉඩ සලසන ලදී.

**විශේෂ ණය යෝජනා ක්‍රම**

2021 මාර්තු 24 - ණය සහන කාලය 2021 සැප්තැම්බර් මස 30 දක්වා දීර්ඝ කිරීමේ සහ සංචාරක කර්මාන්තයේ නියැලි ව්‍යාපාරිකයින්ට ලබා දෙන ලද ණය සඳහා ණය ආපසු ගෙවීමේ කාලය මාස 36ක් දක්වා දීර්ඝ කිරීමේ අරමුණින් සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද සහන ණය පහසුකමෙහි මෙහෙයුම් උපදෙස් සංශෝධනය කරන ලදී.

2021 අප්‍රේල් 05 - නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය (NCRCS) සුමටව ක්‍රියාත්මක කිරීම සඳහා එම ණය යෝජනා ක්‍රමයට අදාළ මෙහෙයුම් උපදෙස් සංශෝධනය කර නැවත නිකුත් කරන ලදී.

2021 අප්‍රේල් 20 - සුදුසුකම්ලත් භෝගයක් ලෙස කහ භෝගය ඇතුළත් කිරීම සඳහා නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමයට අදාළ මෙහෙයුම් උපදෙස් සංශෝධනය කරන ලදී.

2021 මැයි 04 - කෘෂිකාර්මික වටිනාකම් අගයදාමයන් ඇති කරලීම තුළින් කුඩා වතු හිමියන්ගේ ආධිපත්‍ය දරන ගෘහස්ථ කෘෂිකර්මාන්තයට උපකාර කිරීමේ අරමුණ ඇතිව නව ප්‍රතිමූල්‍ය යෝජනා ක්‍රමයක් ලෙස දේශීය කෘෂිකාර්මික සංවර්ධන නියමු ව්‍යාපෘතියට අදාළව (DAD-PP) සහභාගිත්ව මූල්‍ය ආයතන සඳහා මෙහෙයුම් උපදෙස් නිකුත් කරන ලදී.

2021 ජුනි 09 - සියලු අංශ වෙත ලබා දුන් කාරක ප්‍රාග්ධන ණය සඳහා වන ණය සහන කාලය 2021 සැප්තැම්බර් මස 30 දක්වා දීර්ඝ කිරීමට සහ ණය ආපසු ගෙවීමේ කාලය මාස 36ක් දක්වා සංශෝධනය කිරීම සඳහා සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද සහන ණය පහසුකමට අදාළ මෙහෙයුම් උපදෙස් සංශෝධනය කරන ලදී.

2021 සැප්තැම්බර් 01 - ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ සහල් මෝල් හිමියන්ට සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් ලබා දෙනු ලබන ණය සඳහා ණය ඇප ආවරණ යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම සඳහා මෙහෙයුම් උපදෙස් නිකුත් කරන ලදී.

2021 සැප්තැම්බර් 10 - සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද සහන ණය යෝජනා ක්‍රමයේ අදියර I, II සහ III හි ණය සහන කාලය 2021 දෙසැම්බර් 31 දින දක්වා දීර්ඝ කරන ලදී.

- සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය යටතේ 2021 සැප්තැම්බර් 01 දින සිට 2021 දෙසැම්බර් 31 දින දක්වා ණය සහන කාලයක් ලබා දීම.

2021 සැප්තැම්බර් 21 - කුඩා තේ වතු සහ රබර් වතු හිමියන්ගේ පුනර්ජීවන ව්‍යාපෘතිය (STaRR) සහ කුඩා කෘෂි ව්‍යාපාර හවුල්කාර වැඩසටහන (SAPP) යටතේ ණය ගැනුම්කරුවන් සඳහා 2021 සැප්තැම්බර් 01 දින සිට 2021 දෙසැම්බර් 31 දක්වා ණය සහන කාලයක් ලබා දීම.

1 2021 ජනවාරි 01 දින සිට 2022 මාර්තු 15 දින දක්වා ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන ආර්ථික ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ඇතුළත් වේ.

2 2022 අප්‍රේල් 08 දින මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය තවදුරටත් දැඩි කළ අතර, මේ පිළිබඳ විස්තර මෙම වාර්තාවේ 7 වන පරිච්ඡේදයෙහි අඩංගු වේ.

| | |
|---|---|
| 2021 දෙසැම්බර් 01 | - 2021 දෙසැම්බර් මාසය තුළ දී, විදේශ මුදල් ආදායම් උපයන ශ්‍රී ලාංකික ශ්‍රමිකයින්ට එ.ජ. ඩොලරයකට රුපියල් 8ක අතිරේක දිරි දීමනාවක් ලබා දීම සඳහා "විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ සඳහා ලබා දෙන අතිරේක දිරි දීමනා යෝජනා ක්‍රමය" යටතේ මෙහෙයුම් උපදෙස් නිකුත් කරන ලදී. |
| 2021 දෙසැම්බර් 13 | - මහජනතාව අතැති විදේශ මුදල් විධිමත් බැංකු අංශය හරහා යොමු කිරීම ප්‍රවර්ධනය කිරීම සඳහා "අතැති විදේශ මුදල් තැන්පත් කිරීම, පරිවර්තනය කිරීම සහ ආයෝජනය කිරීම සඳහා මහජනතාව දිරිගැන්වීම" සඳහා බලපත්‍රලාභී බැංකු වෙත මෙහෙයුම් උපදෙස් නිකුත් කරන ලදී. ඒ අනුව, මහජනතාවට දිරි දීමනා රැසක් පිරිනමන ලද අතර, 2021 දෙසැම්බර් මාසය තුළ දී ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කරන ලද එවැනි විදේශ මුදල්වලින් සියයට 20ක් ශ්‍රී ලංකා මහ බැංකුවට විකිණීමට බලපත්‍රලාභී බැංකුවලට උපදෙස් නිකුත් කෙරිණි. |
| 2021 දෙසැම්බර් 15 | - 2021 දෙසැම්බර් 13 දිනැති බලපත්‍රලාභී බැංකු වෙත නිකුත් කරන ලද "අතැති විදේශ මුදල් තැන්පත් කිරීම, පරිවර්තනය කිරීම සහ ආයෝජනය කිරීම සඳහා මහජනතාව දිරි දිරිගැන්වීම" සම්බන්ධ මෙහෙයුම් උපදෙස්, මහජනතාව අතැති විදේශ මුදල් සම්බන්ධයෙන් ප්‍රකාශනයක් ඉදිරිපත් කිරීම ඔස්සේ සිදු කල හැකි බව ඇතුළත් වන පරිදි සංශෝධනය කරන ලදී.<br>- 2021 ජූලි 02 දිනැති අති විශෙෂ ගැසට් නිවේදන අංක 2234/49 මගින් ප්‍රසිද්ධියට පත් කරන ලද පනතෙහි 22 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද නියෝගවල වලංගු කාලය, 2022 ජනවාරි 02 දින සිට ඉදිරි මාස 06ක් දක්වා දීර්ඝ කරමින් අති විශෙෂ ගැසට් නිවේදන අංක 2258/23 නිකුත් කරන ලදී. |
| 2021 දෙසැම්බර් 27 | - ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික පුද්ගලයෙකු සමාගමක කොටස් ප්‍රාග්ධනයෙහි ආයෝජනය කිරීම වෙනුවෙන් ලද මුදලින් ආයෝජිතයාගේ ජංගම ගනුදෙනු සිදු කිරීම සඳහා විශේෂ විදේශ මුදල් ගිණුම් (විශේෂ විදේශ මුදල් ගිණුම් ආයෝජිතයා) විවෘත කිරීමේ සහ පවත්වා ගෙන යාමේ නිර්ණායක දක්වමින් 2021 අංක 28 දරන විධානයන් නිකුත් කරන ලදී.<br>- 2021 අංක 28 දරන විධානයන් ප්‍රකාරව කොටස් ප්‍රාග්ධනය වෙනුවෙන් ලද මුදලින් මෙම විධානයන් යටතේ ලබා දී ඇති ප්‍රතිලාභ නැවත අය කර ගැනීමට අවසරය ලබා දෙමින්, 2021 මාර්තු 18 දිනැති අංක 09 දරන ව්‍යාපාරික විදේශ මුදල් ගිණුම් හිමියන් සඳහා වන ප්‍රතිලාභ සඳහා වන විධානයන් සංශෝධනය කරමින් 2021 අංක 29 දරන විධානයන් නිකුත් කරන ලදී.<br>- 2021 මැයි 28, 2021 නොවැම්බර් 01 සහ 2021 දෙසැම්බර් 13 දිනැතිව බලපත්‍රලාභී බැංකු වෙත නිකුත් කරන ලද "විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ සඳහා දිරිගැන්වීමේ යෝජනා ක්‍රමය", "අපනයන ආදායම ශ්‍රී ලංකාවට ආපසු ගෙන්වා ගැනීම" සහ "අතැති විදේශ මුදල් තැන්පත් කිරීම, පරිවර්තනය කිරීම සහ ආයෝජනය කිරීම සඳහා මහජනතාව දිරිගැන්වීම" සඳහා වන මෙහෙයුම් උපදෙස්, බලපත්‍රලාභී බැංකු විසින් රුපියල් බවට පරිවර්තනය කරන ලද විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණවලින් සියයට 25ක් (නැවත දැනුම් දෙන තුරු), අවසර ලත් අඩු කිරීම්වලින් පසු ඉතිරි අපනයන ආදායමෙන් සියයට 25ක් (නැවත දැනුම් දෙන තුරු) සහ රුපියල් බවට පරිවර්තනය කළ අතැති විදේශ මුදල්වලින් සියයට 25ක් (2021 දෙසැම්බර් මාසය තුළ) ශ්‍රී ලංකා මහ බැංකුවට විකිණීමට අවශ්‍ය වන පරිදි සංශෝධනය කරන ලදී.<br>- 2021 දෙසැම්බර් 13 දිනැති සහ 2021 දෙසැම්බර් 15 දිනැති සංශෝධිත "අතැති විදේශ මුදල් තැන්පත් කිරීම, පරිවර්තනය කිරීම සහ ආයෝජනය කිරීම සඳහා මහජනතාව දිරිගැන්වීම" සඳහා නිකුත් කළ මෙහෙයුම් උපදෙස් යටතේ ලබා දෙන දිරි දීමනා, 2022 ජනවාරි 31 දින දක්වා දීර්ඝ කරන ලදී. |
| 2022 ජනවාරි 21 | - ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචිය සහිත බලපත්‍රලාභී හෝටල් සේවා සැපයුම්කරුවන් විසින් ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික පුද්ගලයන්ට සපයන සේවාවන්ට අදාළ ගෙවීම් විදේශ විනිමයෙන් පමණක්ම භාර ගැනීම අනිවාර්යය කරමින්, 2022 අංක 1 දරන හෝටල් සේවා සැපයුම්කරුවන් විසින් ශ්‍රී ලංකාව ඇතුළත විදේශ විනිමය භාර ගැනීමේ රීති ලෙස මුදල් නීති පනත යටතේ අති විශෙෂ ගැසට් නිවේදන අංක 2263/41 නිකුත් කරන ලදී. |
| 2022 ජනවාරි 31 | - 2021 දෙසැම්බර් 01 සහ 2021 දෙසැම්බර් 27 දිනැතිව බලපත්‍රලාභී බැංකු වෙත නිකුත් කරන ලද "විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ සඳහා ලබා දෙන අතිරේක දිරිදීමනා යෝජනා ක්‍රමය" සහ "අතැති විදේශ මුදල් තැන්පත් කිරීම, පරිවර්තනය කිරීම සහ ආයෝජනය කිරීම සඳහා මහජනතාව දිරිගැන්වීම" සඳහා වන මෙහෙයුම් උපදෙස් යටතේ පිරිනමනු ලබන දිරිගැන්වීම්වල වලංගු කාල සීමාව සහ රුපියල් බවට පරිවර්තනය කළ අතැති විදේශ මුදල්වලින් සියයට 25ක් ශ්‍රී ලංකා මහ බැංකුවට විකිණීමේ අවශ්‍යතාවය, නැවත දැනුම් දෙනු තුරු වලංගු වන පරිදි සංශෝධනය කරන ලදී. |
| 2022 පෙබරවාරි 24 | - 2021 මාර්තු 18 දිනැති 2021 අංක 4 දරන පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් පිළිබඳ වන විධානයන්ට සංශෝධනයක් වශයෙන්, විදේශයන්හි රැකියාවේ නියුතු ශ්‍රී ලාංකිකයන්ගේ (විගාමිකයන් හැර) අධ්‍යාපනික ආයතනවල සිසුන් වශයෙන් ලියාපදිංචි වී ඇති ආසන්නතම පවුලේ සාමාජිකයින්ගේ පාඨමාලා හා උපකාරක සේවා ගාස්තු, පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වලින් අදාළ අධ්‍යාපනික ආයතනයේ ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වලට බැර කිරීමේ අවසරය ලබා දෙමින් 2022 අංක 1 දරන විධානයන් නිකුත් කරන ලදී. |

| දිනය | අදාළ අයිතමය | සංශෝධනය |
|---|---|---|
| 2021.10.13 | අර්තාපල්, රතු සහ කහ පරිප්පු (සම්පූර්ණ සහ පියලි කළ) සහ සීනි | මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද පැනවීම දීර්ඝ කරන ලදී (අංක 2249/16 දරන අති විශෙෂ ගැසට් නිවේදනය). |
| 2021.11.02 | සහල් | සහල් සඳහා අදාළ වන කිලෝග්‍රෑමයට රුපියල් 65ක් වන විශේෂ වෙළඳ භාණ්ඩ බද්දෙන් කිලෝග්‍රෑමයට ශත 25ක් අය කරගෙන ඉතිරි වටිනාකම අත් හැරීමට හැකි වන පරිදි මාස හයක කාලයක් සඳහා බදු සහනයක් ලබා දෙන ලදී (අංක 2252/25 දරන අති විශෙෂ ගැසට් නිවේදනය). |
| | බඩඉරිඟු | මෙට්‍රික් ටොන් 2,000ක උපරිමයකට යටත්ව, රජයට අයත් ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ් ආයතනය විසින් ත්‍රිපෝෂ නිෂ්පාදනය සඳහා බඩඉරිඟු ආනයනය කිරීමේදී, ඒ සඳහා අදාළ වන කිලෝග්‍රෑමයට රුපියල් 25ක් වන විශේෂ වෙළඳ භාණ්ඩ බද්දෙන් කිලෝග්‍රෑමයට රුපියල් 1ක් අය කරගෙන ඉතිරි වටිනාකම අත් හැරීමට හැකි වන පරිදි මාසයක කාලයක් සඳහා බදු සහනයක් ලබා දෙන ලදී (අංක 2252/9 දරන අති විශෙෂ ගැසට් නිවේදනය). |
| 2021.11.23 | දිසිදි පොල් | මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද පැනවීම දීර්ඝ කරන ලදී (අංක 2255/8 දරන අති විශෙෂ ගැසට් නිවේදනය). |
| | | කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ නිර්දේශයට යටත්ව, රජයට අයත් බී.සී.සී. ලංකා ලිමිටඩ් ආයතනය විසින් දිසිදි පොල් ආනයනය කිරීමේ දී, ඒ සඳහා අදාළ වන කිලෝග්‍රෑමයට රුපියල් 300ක් වන විශේෂ වෙළඳ භාණ්ඩ බද්දෙන් කිලෝග්‍රෑමයට රුපියල් 1ක් අය කරගෙන ඉතිරි වටිනාකම අත් හැරීමට හැකි වන පරිදි මාස හයක කාලයක් සඳහා බදු සහනයක් ලබා දෙන ලදී (අංක 2255/8 දරන අති විශෙෂ ගැසට් නිවේදනය). |
| 2021.12.21 | බඩඉරිඟු | සත්ත්ව නිෂ්පාදන සහ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අනුමැතිය/නිර්දේශ ලබා ගෙන ඇති සත්ත්ව ආහාර නිෂ්පාදකයින් සඳහා "සත්ත්ව ආහාර" නිෂ්පාදනයට අවශ්‍ය කරන බඩ ඉරිඟු උපරිම වශයෙන් මෙට්‍රික් ටොන් 40,000ක ප්‍රමාණයක් ආනයනය කිරීමේ දී, ඒ සඳහා අදාළ වන කිලෝග්‍රෑමයට රුපියල් 25ක් වන විශේෂ වෙළඳ භාණ්ඩ බද්දෙන් කිලෝග්‍රෑමයට රුපියල් 10ක් අය කරගෙන ඉතිරි වටිනාකම අත් හැරීමට හැකි වන පරිදි මාස හයක කාලයක් සඳහා බදු සහනයක් ලබා දෙන ලදී (අංක 2259/9 දරන අති විශෙෂ ගැසට් නිවේදනය). |
| 2021.12.31 | අර්තාපල් සහ බොම්බයි ළූණු | මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි අර්තාපල් ආනයනය මත වන විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද කිලෝග්‍රෑමයට රුපියල් 50 සිට කිලෝග්‍රෑමයට රුපියල් 20 දක්වා අඩු කරන ලද අතර, බොම්බායි ළූණු ආනයනය සඳහා වන විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද කිලෝග්‍රෑමයට රුපියල් 40 සිට කිලෝග්‍රෑමයට රුපියල් 10 දක්වා අඩු කරන ලදී (අංක 2260/72 දරන අති විශෙෂ ගැසට් නිවේදනය). |
| 2022.01.11 | සහල් සහ සීනි | මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද පැනවීම දීර්ඝ කරන ලදී (අංක 2262/15 දරන අති විශේෂ ගැසට් නිවේදනය). |

2022 ජනවාරි 13 - 2022 ජනවාරි 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි, රාජ්‍ය සේවකයන් සහ විශ්‍රාමික තැනැත්තන් සඳහා විශ්‍රාම වැටුප් ගණනය කිරීමේ දී සැලකිල්ලට ගනු නොලබන, රුපියල් 5,000ක මාසික දීමනාවක් ලබා දෙන ලදී (අංක 03/2022 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය).

2022 මාර්තු 08 - විදුලිය සහ ඉන්ධන පරිහරණය අවම කිරීම සඳහා රාජ්‍ය අංශය වෙත මාර්ගෝපදේශ නිකුත් කරන ලදී (අංක 04/2022 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය).

**රාජ්‍ය ණය කළමනාකරණය**

2021 ජනවාරි 26 - වෙළඳපොළ යථා තත්ත්වයට පත් ව ජාත්‍යන්තර ප්‍රාග්ධන වෙළඳපොළෙහි අරමුදල් රැස්කිරීම රජයට හිතකර වන තෙක් භාණ්ඩාගාරයට අවශ්‍ය විදේශ අරමුදල් සම්පාදනය කිරීම පහසු කිරීම සඳහා ඈපකර අරමුදල් සම්පාදනය සහ / හෝ විදේශ මුදල් මූලාශ්‍ර තත්ත්වයන් මත ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර සෘජු නිකුතු ක්‍රමය යටතේ බැංකු සඳහා නිකුත් කිරීමට කටයුතු කරන ලදී.

2021 පෙබරවාරි 03 - භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසි සඳහා පිළිගනු ලබන උපරිම ඵලදා අනුපාතිකය දින 364 පරිණත කාලයට පමණක් අදාළ වන පරිදි ප්‍රකාශයට පත් කිරීමට හා දින 91 සහ දින 182 පරිණත කාලයන් සඳහා වන ඵලදා අනුපාතික දින 364 සඳහා තීරණය වන ඵලදා අනුපාතිකයට අනුකූල වන පරිදි තීරණය කරන ලද අතර සියලුම භාණ්ඩාගාර බැඳුම්කර පරිණත කාලයන් සඳහා වෙන්දේසියේ දී පිළිගනු ලබන උපරිම ඵලදා අනුපාතික ප්‍රකාශයට පත් කිරීම තවදුරටත් ක්‍රියාත්මක කරන ලදී.

2021 මාර්තු 26 - ද්විතීයික වෙළඳපොළ ගනුදෙනු පිළිබඳ ක්‍රියාපිළිවෙත් වැඩිදියුණු කිරීම හා ශක්තිමත් කිරීම, ගනුදෙනුවල විශ්වසනීයත්වය ඉහළ නැංවීම සහ ආයෝජකයන්ගේ ආරක්ෂාව සහ විශ්වාසය වැඩි කිරීම යන අරමුණු සහිතව ද්විතීයික වෙළඳපොළෙහි සිදුවන සියලුම රජයේ සුරැකුම්පත් ගනුදෙනු, එම ගනුදෙනු සිදු කරන දිනයේම වාර්තා කිරීමට ක්‍රියාමාර්ග ගන්නා ලදී. ඒ අනුව, ලංකාසෙට්ල් පද්ධතියේ සියලුම සහභාගිකරුවන් විසින් සිදු කරන සියලුම ගනුදෙනු, ශ්‍රී ලංකා මහ බැංකුවට වාර්තා කිරීම, 2021 අප්‍රේල් 01 දින සිට ක්‍රියාත්මක විය.

2021 ජුනි 07 - අක්වෙරළ ණයගැනීම් තුළින් ඇතිවන විදේශ විනිමය අවදානම අඩු කර ගැනීමට, අක්වෙරළ අරමුදල් එහි ශක්‍යතාවයන් මත රැස් කිරීම වැඩිදියුණු කිරීම සහ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර වැනි අරමුදල් සඳහා පහසුකම් සැලසීමේ මාර්ග ඇති කිරීම මගින් පෞද්ගලික අංශය දිරිමත් කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලදී.

2021 ජුනි 09 - විදේශයන්ගෙන් ලැබෙන අරමුදල් එ.ජ.ඩොලරයෙන් නාමනය කරන ලද ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර හා ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර තුළ සමානව බෙදී යන සේ ආයෝජනය කිරීමට බලපත්‍රලාභී වාණිජ බැංකු සඳහා සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුව සඳහා පහසුකම් සැපයීමට කටයුතු කිරීම තුළින් තවදුරටත් විදේශ අරමුදල් රට තුළට ගලා ඒමට අවස්ථාව සැලසීමට කටයුතු කරන ලදී.

2021 ජුනි 14 - සහතික කළ ණයෙහි උපරිම මට්ටම, දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 10 සිට සියයට 15 දක්වා ඉහළ නැංවීමට සහ රජයේ සම්පූර්ණ ණය වගකීම් (පවත්නා විනිමය අනුපාතයට අනුව බාහිර ණය ඇතුළුව) දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 60ට අඩුවෙන් පවත්වාගෙන යාමේ ඉලක්කගත කාලසීමාව 2020 අවසානයේ සිට 2030 අවසානය දක්වා මාරු කිරීමට 2003 අංක 3 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනත, 2021 අංක 12 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම්) (සංශෝධන) පනත මගින් සංශෝධනය කරන ලදී.

2021 ජුනි 23 - භාණ්ඩාගාර බිල්පත් සම්බන්ධයෙන් පවතින මූල්‍ය සීමාව, රුපියල් බිලියන 2,000 සිට රුපියල් බිලියන 3,000 දක්වා ඉහළ නංවන ලදී (පාර්ලිමේන්තු අංක 80 න්‍යාය පත්‍රය).

2021 ජූලි 08 - විදේශයක සිටින පුද්ගලයෙකුගෙන් ලබා ගන්නා ලද විදේශ විනිමය ණයවලින් සියයට 50ක් ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර තුළ හා ඉතිරි සියයට 50 ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර තුළ ආයෝජනය කිරීමට ශ්‍රී ලංකාව තුළ පිහිටුවන ලද සමාගම් සඳහා අවසර ලබා දීමට කටයුතු කරන ලදී.

2021 ජූලි 20 - පහත ලක්ෂණ සහිතව සෘජු නිකුතු කවුළුවක් හඳුන්වා දෙමින් භාණ්ඩාගාර බැඳුම්කර ප්‍රාථමික නිකුතු ක්‍රමවේදය තවදුරටත් පුළුල් කරන ලදී.

- ප්‍රාථමික වෙන්දේසියක පළමු අදියරේ දී සම්පූර්ණයෙන් පිළිගන්නා ලද සුරැකුම්පත් හඳුනාගැනීමේ ජාත්‍යන්තර අංකයන් සඳහා වෙන්දේසියේ දී තීරණය කරන ලද බරිත සාමාන්‍ය ඵලදා අනුපාතික යටතේ, අදාළ සුරැකුම්පත් හඳුනාගැනීමේ ජාත්‍යන්තර අංකවලින් වෙන්දේසියට ඉදිරිපත් කරන ලද ප්‍රමාණයෙන් සියයට 20ක උපරිමයකට යටත්ව සෘජු නිකුතු කවුළුව වෙන්දේසිය පියවන දිනයට පෙර දිනය දක්වා විවෘත වනු ඇත.
- නිකුතු කවුළුව තුළින් ඉදිරිපත් කළ ප්‍රමාණය අභිබවා ලංසු ලැබුණහොත් වෙන්දේසියේ පළමු අදියර තුළ දී එක් එක් සුරැකුම්පත් හඳුනාගැනීමේ ජාත්‍යන්තර අංක සඳහා වෙන්දේසියේ දී ලද සාර්ථකත්වයට සමානුපාතිකව සහභාගිවූවන් අතර වෙන් කිරීම් සිදු කරනු ඇත.

2021 සැප්තැම්බර් 22 - 2021 සැප්තැම්බර් මස 22 දින සිට බලපැවැත්වෙන පරිදි, පරිණත කාලය දින 364 සහිත භාණ්ඩාගාර බිල්පත් සඳහා උපරිම එලදා අනුපාතිකය ප්‍රකාශයට පත් කිරීම අත්හිටුවන ලදී.

2021 සැප්තැම්බර් 23 - මාර්ගගත භාණ්ඩාගාර බැඳුම්කර පද්ධතියේ තෙවන අදියර ක්‍රියාත්මක කිරීම සඳහා වන අවම පිළිගැනීමේ අවශ්‍යතාවය එක් එක් සුරැකුම්පත් හඳුනාගැනීමේ ජාත්‍යන්තර අංකය යටතේ පළමු අදියරෙහි පිළගත යුතු අවම ලංසු ප්‍රමාණය වෙන්දේසිය සඳහා ඉදිරිපත් කළ වටිනාකමෙන් සියයට 80 දක්වා ඉහළ නංවන ලදී. තවද, භාණ්ඩාගාර බැඳුම්කර නිකුතු ක්‍රියාවලියෙහි තෙවන අදියර ක්‍රියාත්මක කිරීම පරිණත කාලය වසර 5 හෝ ඊට අඩු පරිණතයන් සඳහා පමණක් සීමා කරන ලදී.

2021 දෙසැම්බර් 24 - අංක 2251/42 දරන 2021 ඔක්තෝබර් 28 දිනැති අති විශෙෂ ගැසට් පත්‍රයට අනුව, භාණ්ඩ හා සේවා අපනයන ආදායම් උපයන්නන් සහ විදේශයන්හි සේවය කරන ශ්‍රී ලාංකිකයන්ද ඇතුළුව අනෙකුත් සියලුම විදේශ ව්‍යවහාර මුදල් හිමියන් සඳහා ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවල ආයෝජනයට අවස්ථාවක් සලසා දීම පිණිස ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර සඳහා ඍජු නිකුතු කවුළුවක් හඳුන්වා දෙන ලදී.

2022 පෙබරවාරි 01 - ඍජු නිකුතු කවුළුව හරහා ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවල ආයෝජන රැගෙන එනු ලබන ආයෝජන සැකසුම්කරුවන් ද ඇතුළු පත් කළ නියෝජිතයන් සඳහා දිරිදීමනාවක් ලබා දීමේ ක්‍රමවේදයක් හඳුන්වා දෙන ලදී. ඒ අනුව, එ.ජ.ඩොලර් රැගෙන ආ ආයෝජන මුදල, පදනම් අංක 50කින් (සියයට 0.5) ගුණ කර එම අගය, පියවීමේ දිනයෙහි පවතින එ.ජ.ඩොලර් විදේශ විනිමය අනුපාතිකය අනුව ශ්‍රී ලංකා රුපියල්වලට හැරවීමෙන් පසු ලැබෙන මුදල, දිරිදීමනාවක් වශයෙන් ගෙවනු ලබයි. එම දිරිදීමනාව, පත් කළ නියෝජිතයන් මාර්ගයෙන්, අදාළ ශ්‍රී ලංකා රුපියල්වලින් නාමනය කරන ලද බැංකු ගිණුම්වලට මුදා හරිනු ලබයි.